**සාරය:** සුමිහිරි දරුවනි, සදාතනික ශල්‍ය වෛද්‍යවරයාගෙන් කිසිම දෙයක් සඟවන්න එපා. කුමන හෝ කාරණයක් සම්බන්ධයෙන් ඔබ අකීකරුව සිටිනවා නම් එයට සමාව ඉල්ලන්න. නැතිනම්, ඒ බර තව තවත් වැඩි වර්ධනය වී ඔබ නාමයට අගෞරව කරනා කෙනෙක් බවට පත් වේවි.

**ප්‍රශ්නය:** සැබෑ ආදායමක පදනම කුමක්ද? ස්ව වර්ධනයට බාධක ඇතිවන්නේ ඇයි?

**පිළිතුර:** සැබෑ ආදායමකට පදනම වන්නේ අධ්‍යාපනයයි. ඔබ හොඳින් ඉගෙන ගත්තේ නැතිනම් ඔබට හොඳ ආදායමක් උපයා ගත නොහැකි වේවි. ඔබ තබාගෙන සිටිනා ආශ්‍රය යහපත් ආශ්‍රයක් නොවෙයි නම් වර්ධනයේ දී බාධක ඇති වෙනවා. යහපත් ආශ්‍රය ඔබව එගොඩ කරවනා අතර නරක ආශ්‍රය ඔබව ගිල්වා දමනවා කියා කියනවා. ඔබ සිටින්නේ නරක ආශ්‍රයක නම්, ඔබ හොඳින් අධ්‍යයනයේ නිරත නොවන නිසා අසමත් වීමට සිදු වෙනවා. එකිනෙකාව අපායේ අගාධයටම ඇද දමන්නේ ඒ ඒ අය තබා ගෙන සිටිනා ආශ්‍රයයි. මෙන්න මේ නිසා තමයි ඔය දරුවන් තමා විසින් තබාගෙන සිටිනා ආශ්‍රය කෙරෙහි වඩාත් සැලකිලිමත් විය යුත්තේ.

**ගීතය:** ඔබ ස්නේහ සාගරයයි: එක් බිඳක පිපාසාවෙන් අපි සිටින්නෙමු.

ඕම් ශාන්ති. දරුවන් ගයන්නේ අසීමිත පියාගේ ගුණ වර්ණනාවයි. මෙම ගුණ වර්ණනාව භක්ති මාර්ගයට අයත් වූවකි. අගනා දරුවන් වන ඔබලා පරම පියාට ඔහුගේ ගුණ පුද්ගලිකවම ගායනා කරනවා. අසීමිත පියා පැමිණ සිටිනා බවත් ඔහු අපට ඥානය දී අපව දිව්‍යලෝකයේ හිමිකරුවන් කරවනා බවත් ඔබලා දන්නවා. මන්ද, ඥාන සාගරය වන්නේ ඔහුම පමණයි. පරමාත්මය ළඟ ඇති ඥානය හඳුන්වන්නේ පරම ඥානය ලෙසයි. පරමාත්ම ජීවය වන පරම පියා තමයි ඥානය දෙන කෙනා. කාටද? දරුවන්ට. ඔබගේ මමාට ඥානයට අධිපති දෙවඟන යන නම දී තිබෙනවා, ජගදම්බා ඥානයට අධිපතිනිය වන නිසා ඇයගේ දරුවන්ටත් එම ඥානයම තිබිය යුතුයි. දෙවියන් සරස්වතිට, ඥානයේ අධිපතිනියට දැනුම දෙනවා. නමුත් ඒ කවුරුන් හරහාද ඔහු දැනුම දෙන්නේ? මේවා ඉතාමත් හොඳින් තේරුම් ගත යුතු කරුණුයි. ජගදම්බා යනු කවුදැයි කියා ලෝකයා දන්නේ නැහැ. සිටින්නේ එකම එක ජගදම්බා කෙනෙක් බව ඔය දරුවන් දන්නවා. ඇයට නම් රාශියක් දී තිබෙනවා. සරස්වතී ප්‍රජාපිතා බ්‍රහ්මාගේ කටින් උපන්තියක් බව ඔවුන් දන්නේ නැහැ. ඇයට ඥානය දෙන්නේ පරමාත්ම පියායි. පරමාත්ම පියා ලෝක නාටක චක්‍රය කරකැවෙන්නේ කෙසේද යන දැනුම ඔබලාට දෙනවා. පරම පියා ඔය දරුවන්ට ඥානය දෙනවා. සරස්වතීට එය ලැබුණේ කෙසේද? ඇය ප්‍රජාපිතා බ්‍රහ්මාගේ මුඛයෙන් උපන්තියක් වන නිසා ඔහුගේ මුඛයෙන්ම පරමාත්ම ජීවය වන පරමාත්ම පියා අනිවාර්යෙන්ම සරස්වතීට ඥානය දෙන්න ඇති. ඒ ඥානයම ඔහු අන් අයටත් දෙන්න ඇති. ඔබට උගන්වන්නේ දෙවි පියාණනුයි. ඉතින් එමනිසා, අනිවාර්යෙන්ම පරම පියාගේ දරුවනුත් මාස්ටර් දෙවිවරුන් වේවි. මෙන්න මේ නිසා තමයි ඇයට ඥානයට අධිපති යන නම වැටී තිබෙන්නේ. ඔබත් ඔබලාගේ මමාත් ගීතාවේ දෙවියන් වන ඥාන සාගරයෙන් ඥානය ලබනා බව ඔය දරුවන් දැන් දන්නවා. පරමාත්මය එකයි. කිසිම දේවතාවකට හෝ මනුෂ්‍යයෙකුට පරමාත්මය වෙන්න බැහැ. ඇය ඥානයේ දෙවඟන වෙනවා නම් ඇය සතුව ඇති ඥානය කුමක්ද? රාජයෝග ඥානයයි. මෙම පහසු රාජයෝගාවෙන් තමයි ඥානයට දෙවඟන වන සරස්වතී, ධනයට දෙවඟන වන ලක්ෂ්මී ද වන්නේ. ඥාන දෙවඟනගේ ගුණ ගැයෙනවාක් සේම ඔය දරුවන්ගේත් ගුණ ගැයෙනවා. සෑම කෙනෙක්ම ප්‍රජාපිතාගේ දරුවනුයි. ඔවුන් මමාගේ දරුවන් කියා හඳුන්වන්නේ නැහැ. ඔවුන් බ්‍රහ්මාගේ පද්ම මුඛයෙන් ඉපදුණු අයයි. දේව දරුවන් වන ඔබ සියලු දෙනා තුළම හොඳ ශ්‍රද්ධාවක් තිබෙනවා. පරමාත්ම පියා කියනවා: මම පෙනී සිටින්නේ මගේ දරුවන් ඉදිරියේ පමණයි. මාව දන්නා එකම එක පිරිස ඔවුන් පමණයි. ඉතින් ජගදම්බා තමයි ඥානයේ දෙවඟන. මෙය පහසු රාජයෝගාවේ දැනුමයි, ග්‍රන්ථ වල ඇති දැනුමක් නොවෙයි. පරමාත්මය ඇයට මෙම ඥානය දුන්නා ඇයව දෙවඟනක් ලෙස හැඳින්වූවා. ජගදම්බා මාතාවයි. පසුව ඇයගේ ඊළඟ උපතේ දී ඇය ධනයේ දෙවඟන, ලක්ෂ්මී වෙනවා, මිනිසුන් සෑම කෙනෙක්ම කන්නලව් කරන්නේ ඇයටයි. එමනිසා, මෙයින් අදහස් වන්නේ ජගදම්බාත් රාජයෝග උරුමය පරම පියාගෙන් ලබනා බවයි. ඇයව හඳුන්වන්නේ ඥානයට අධිපති දෙවඟන ලෙසිනුයි. දැනුම ආදායමක් උපයා ගත හැකි මගයි. සැබෑ පියාගෙන් ඔබ උපයනා මෙය ඔබගේ සැබෑම ආදායමයි. ඔබ දැන් තමන් විසින් දරණා උත්සාහයේ තරමට සැබෑ ආදායමක් උපයා ගන්නවා. ඔබ හොඳින් ඉගෙන ගත්තේ නැතිනම් හොඳ ආදායමක් උපයා ගත හැකි වන්නේ නැහැ. යහපත් ආශ්‍රයක් පවත්වා ගත්තේ නැතිනම් හොඳින් ඉගෙන ගැනීමට හැකි වන්නේත් නැහැ, කිසිම වර්ධනයක් ලද හැකි වන්නේත් නැහැ. යහපත් ආශ්‍රය ඔබව එගොඩ කරවනා අතර නරක ආශ්‍රය ඔබව ගිල්වනවා. තබා ගෙන සිටිනා නරක ආශ්‍රය නිසා ඔබ හොඳින් ඉගෙන ගත්තේ නැතිනම් ඔබ අසමත් වී සෑම දිනකම පිටුපසින්ම අසුන් ගනීවි. මෙයට හේතුව ගුරුවරයා දන්නවා, නමුත් පරම පියා දන්නේ නැහැ. ඔබ හොඳින් ඉගෙන ගෙන නැති බවත් නරක ඇසුර නිසා අසමත් වී සිටිනා බවත් පියා අනිවාර්යෙන්ම තේරුම් ගනීවි. උදාහරණයක් ලෙස දැක්වූවහොත්, ඔවුන් එකිනෙකාට ආදරය කරමින් හොඳින් ඉගෙන ගත්තේ නැතිව සිටියොතින් ඔවුන් කරන්නේ එකිනෙකාව අපායේ ආගාධයටම ගෙන යාමයි. ඔවුන් හොඳින් ඉගෙන ගත්තේ නැති නිසා වෙන වෙනම තැබිය යුතු බව පියාට වැටහෙනවා. අධ්‍යාපනයකින් තොරව සිටිනා අයව හඳුන්වන්නේ අඥානයින් ලෙසයි. හොඳින් ඉගෙන ගන්නවා නම් ඔවුන් ඥානවන්තයින් ලෙස හැඳින්වෙනවා. පරමාත්මයේ උපදෙස් ඔබ නිසි ලෙස පිළිපැද්දේ නැතිනම්, ඔබලා අනු-දරුවන් වෙනවා. කෙසේවෙතත්, ඔවුන්ට මෙහි අර්ථය වැටහෙන්නේ නැහැ. හොඳින් ඉගෙන නොගන්නා අය අපිරිසිදුවට සිටිනවා: ඔවුන් අසමත් වන අතර පසුව පැන යනවා. පරම පියා කියනවා: මී රාවණ, ඔබ මගේ දරුවනුත් ගිල ගන්නවා. ඔබ නම් මහා බලවතෙක්. ඉන් අනතුරුව දරුවන් සාතන්ගේ මඟ දිගේ යනවා, ශ්‍රීමත් පිළිපදින්නේ නැහැ. තමන්ටම පොරොන්දු

වන්නː මම සෑම පියවරකදීම බාබාගේ උපදෙස් අනුගමනය කරන්නම්. ශ්‍රීමත් අනුගමනය නොකරනා අය අමනුස්ස මත ඇති අය ලෙසින් හැඳින්වෙනවා. එවන් අයට ඉහළ තත්ත්වයක් දිනා ගත නොහැකි බව බාබාට එවිට අවබෝධ වෙනවා. යම් කෙනෙකුට හොඳින් පැහැදිලි කිරීමට නොහැකි වේ නම් ඔබ රාවණ ගේ බලපෑමට ලක් වී ඇති බව තමයි කියන්න වෙන්නේ. බුද්ධිය පාරිශුද්ධ වීමට තරම් ඔබ තුළ යෝගාවක් නැහැ. බුද්ධියේ යෝගාවත් තිබිය යුතුයි. පරමාත්මගේ දරුවන්ගේ හැසිරීමත් ඉතාමත් රාජකීය විය යුතුයි. උපතින්ම දක්ෂ රජ කෙනෙක් සිටිය නොහැකියි. මෙන්න මේ නිසා තමයි බාබා කියන්නේː ශ්‍රීමත් පිළිපැද ඔබ රාවණගේ පස් පව් දමනය කළ යුතුයි. ශ්‍රීමත් පිළිනොපදිනා අය ගැන බාබා කියාවිː ඔවුන් අමනුස්ස මත පිළිපදින්නනුයි. කෙනෙක් 5% කින් ශ්‍රීමත් පිළිපදිනා අතර තවත් කෙනෙක් 10%කින් පිළිපදීවි. ගිණුමක් තිබෙනවා. ඉතින් ජගදම්බා කියන්නේ එකම එක කෙනෙකුයි. ඇය බ්‍රහ්මාගේ මුඛයෙන් උපන් ජගදම්බා සරස්වතියි. ඒ ඇයගේ සම්පූර්ණ නමයි. සරස්වතීව සිතාරයක් අතැතිව පෙන්වනවා. ඇය ඥාන දෙවඟනයි, ඇයගේ දරුවනුත් අනිවාර්යෙන්ම ඇති. ඔවුන් ළඟත් සිතාර ඇති. බලන්න, කල්ප රුක පෙන්වන පින්තූරයේ සරස්වතීත් සිටිනවා. ඇය රාජයෝගා උගන්වා පසුව ධනයේ දෙවඟන ලක්ෂ්මී වෙනවා. සුවය, ධනය හා සතුට සියල්ලම එහි අන්තර්ගතයි. පරම පියා පරමාත්මය හැරෙන්න වෙන කිසිම කෙනෙක්ට මෙය ඔබට දිය නොහැකියි. ඔහු දෙවි පියාණන් වේ. බලන්න, මමා දැන් සේවය කරනවා. උදාහරණයක් ලෙස කියනවා නම්, කෙනෙක් මමාට ආරාධනා පත්‍රයක් දුන්නොත් ඔවුන් පළමුව මමාගේ රාජකාරිය දැන ගත යුතුයි. පළමුවෙන්ම ඇය කවුද යන්න දැන ගත යුතුයි. ලෝකය මේ ගැන දන්නේ නැහැ. ඔවුන් කියනවාː ක්‍රිෂ්ණාව අපහාසයට ලක් කර තිබෙනවා, නමුත් එය සිදු විය නොහැකියි. ඒක සිදු විය නොහැක්කක්. වැඩිපුරම අපහාසයට ලක් වන්නේ ශිව බාබායි, බ්‍රහ්මා දෙවනුවටයි. ක්‍රිෂ්ණා සහ බ්‍රහ්මා; නමුත් කිසිම කෙනෙක්ට ක්‍රිෂ්ණාට අපහාස කරන්න බැහැ. ඥාන දෙවඟන සරස්වතී අනාගතයේ දී රාධේ වන බව මිනිස්සු දන්නේ නැහැ. ඇයගේ විවාහයෙන් පසුවයි ඇය ලක්ෂ්මී වූයේ, ධන සම්පත් වලට දෙවඟනක් වූයේ. ඒ තුළ නිරෝගී සුවය, ධනය හා සතුට සියල්ල අන්තර්ගතයි. මෙය පැහැදිලි කිරීමට ඔබ තුළ ඉමහත් කුල්මත් බවක් තිබිය යුතුයි. මමා කවුද යන්න ඔබ පැහැදිලි කළ යුතුයි. ඇයයි සරස්වතී, බ්‍රහ්මාගේ මුඛයෙන් උපන් දියණියයි. භාරත ජනයා කිසිම දෙයක් දන්නේ නැහැ. ඔවුන්ට මොන දැනුමක් වත් නැහැ. තිබෙන්නේ බොහෝ සේ අන්ධ විශ්වාසයයි. ඔවුන් වඳින අය ගැනවත් ඔවුන් දන්නේ නැහැ. කිස්තියාණීන් ඔවුන්ගේ ක්‍රිස්තු ගැන දන්නවා. සීඛ්වරු දන්නවා ඔවුන්ගේ සිඛ් ආගම ස්ථාපනය කළේ ගුරුනානක් බව. ඔවුන් තම ආගමේ ප්‍රාරම්භකයා ගැන දන්නවා. එය හුදෙක් හින්දූවරුන්, භාරතයේ මිනිස්සුයි නොදන්නේ. ඔවුන් අන්ධ විශ්වාසයෙන් වැඳුම් පිදුම් කරමින් සිටින්නේ ඔවුන්ගේ වෘත්තිය ගැන අවබෝධයක් නැතිවයි. මන්දයත්, ඔවුන් චක්‍රයේ කාල පරාසය දිගුකර තිබෙනවා. ඔවුන්ට කිසිවක් නොවැටහේ. ඉස්ලාම් සහ බෞද්ධයන් පසුව පැමිණෙයි. නියතවම එම දේවතාවරු ඔවුන්ටත් කලින් තමයි සිටියේ. ඔවුන් මේ කාලය වන තෙක්ම මෙහි සිටිනු ඇත. සියලුම ධර්මයන් අඩ චක්‍රය තුළ පෙන්වයි නම් එවිට එලෙසම අඩ චක්‍රයක් මෙම ධර්මය තිබෙන බවත් පෙන්වන්න ඕන. එය වසර සියදහස් ගණන් දීර්ඝ එකක් කියා ඔබට කිව නොහැකියි. ජගදම්බා කෝවිල් වලට ගොස් පැහැදිලි කරන්නː මේ ඥාන දෙවඟනට දැනුම ලබා දී ඇත්තේ කවුරුන් විසින් ද? ජගදම්බාට දැනුම ක්‍රිෂ්ණා දුන්නා යැයි පවසා නැත. කෙසේවෙතත්, මෙය ඉතා හොඳින් පුහුණු වන අයට තමයි පැහැදිලි කළ හැක්කේ. සමහර අයට බොහෝ ශරීර අවධානය ඇත. ඔවුන් නොකඩවා ඥාතියෙකු, මිත්‍රයන් කවුරු හෝ කෙනෙක්ව මතක් කරමිනුයි සිටින්නේ. එරම පියා කියයිː ඔබ අන් කෙනෙක්ව සිහිපත් කරන්නේ නම්, මා සිහිපත් කිරීමට අමතක කරයි. ඔවුන් මෙසේ ද ගයනවාː අපි අන් සියලු දෙනා හා තිබෙන සම්බන්ධය විසන්ධි කර එක්කෙනා හා පමණක් සම්බන්ධ වෙමු කියා. ඒ කෙනා තමයි මෙහි ඉඳගෙන ඉන්නේ. බාබා මා ඔබට අයිති වී ඔබේ උපදෙස් අනුගමනය කරමින් සිටිනවා. ඔබේ නමට කැළැලක් වන අයුරින් මා කිසිම දෙයක් කරන්නේ නැහැ. බාබාගේ නමට අපකීර්තියක් ඇති වන අන්දමින් එවන් ක්‍රියාවල යෙදෙන දරුවන් බොහෝ සිටී. මෙය වටහාගන්නා තෙක්ම නොනවත්වා ඔවුන් නින්දා කරමින් සිටීවි. නාමය කීර්තියට පත්විය යුතුයි. අහෝ දෙවියනී, ඔබේ දිව්‍යමය ක්‍රියාවන් සිහිපත් කර ඇත! කෙසේවෙතත්, මෙය අන් කිසිවකු වටහා නොගන්නා බව ඔය දරුවන්ට වැටහේ. එරම පියා කියයිː දරුවනී, මා කරන්නේ පරාර්ථකාමී සේවයයි. මට නින්දා කළ අයවත් මා උසස් කරනවා. කොහොම වෙතත්, මා සෑම තැන්වලම සිටින කෙනෙක්ය කියා මිනිස්සු මට නොසෑහෙන්න නින්දා කරනවා. මා මේ දැනුම ඔය දරුවන්ට දෙනවා. එමනිසා, මෙම යග්යාවට යක්ෂ සමූහය වෙතින් බොහෝ බාධක ඇතිවෙනවා. මෙය නිසි අයුරින් වටහා නොගන්නා දරුවන් නිසා සියලු කුණු කන්දල් මෙහි කඩා හැලෙයි. මා නින්දාවට පත්කළේ ඔවුන්ය. සමහර දරුවන් ඉතා හොඳින් සේවය කරන අතර අනෙක් අය අවසේවයයි කරන්නේ. එක් පැත්තකින් සමහරු සංවර්ධනයත් අනෙක් පැත්තෙන් සමහරු විනාශයත් ඇති කරනවා. මන්ද, ඔවුන්ට දැනුම නොමැත. සූර්ය සහ චන්ද්‍ර රාජ වංශයන් ස්ථාපිත වෙමින් තිබේ. ඔබ මෙය පූර්ණ වැටහීමක් නැති අයට පැහැදිලි කරන්න ඕන. ඔවුන්ට අනුකම්පා කෙරෙනු ඇත. එරම පියාට අයිති වීමෙන් පසුවත් කෙනෙකු සිය උරුමය ලබාගන්නේ නැතිනම්, ඔහුගෙන් ඇති ඵලය කුමක් ද? ඔබට පියා හම්බවුණු නිසා ඔබේ උරුමය ලබන්නට පූර්ණ උත්සාහය කරමින් ශ්‍රීමත් අනුගමනය කළ යුතුයි. පරම පියා නමට කැළලක් ඇතිවන අයුරින් මොනම ක්‍රියාවක් වත් නොකරන්න. එරම පියා දන්නවා, රාගය සහ කෝපය මහා සතුරා බව. එය නොකඩවා ඔබේ නාසයෙන් සහ කණින් අල්ලා ගනී. එය සිදුවෙනවා, නමුත්, ඔබ ඉන් ඉක්මවා යන්න ඕන. සමහර අය කිසියම් කෙනෙකුගේ නමට රූපයට අසුවෙනවා. දරුවන් හැමෝම එක වාගේ නැහැ. තවමත් පරම පියා ඔබට අනතුරු අඟවයිː ප්‍රවේසම් වන්න! ඔබ වැරැදි කියා කර මා හට නින්දා කළොත් ඔබේ තත්ත්වය නැති වී යාවි. මායාත් බලවත් අය සමඟ බලවත් වී ඔවුන් හා සටන් වදී. ඔබ පරම පියා ස්මරණය කරන විට මායාගේ කුණාටු ඔබව වෙන තැනකට අරන් යයි. ඇතැම් දරුවන් ඇත්ත

නොපවසන අතර උපදෙස් බලාපොරොත්තු වන්නේ ද නැත. සදාතනික ශල්‍යවෛද්‍යවරයා ගෙන් ඔබ කිසිවක් නොසැඟවිය යුතුයි. ඔහුට නොපැවසුවොත් ඔබ තව තවත් කිලිටි වේවි. බාබා ජනීජනන් හාර් (අභ්‍යන්තර රහස් දන්නා) සහ සියල්ල දන්නා කෙනා යැයි නොසිතන්න. ඔබේ අකීකරු වීම ගැන ශිව බාබාට පැවසිය යුතුයි. ශිව බාබා මම මේ වැරැද්ද කළා. දැන් මා ඔබෙන් ඊට සමාව අයදින්න කැමැතියි. ඔබ සමාව ඉල්ලුවේ නැතිනම්, ඔබ දිගටම වැරැදි කරාවි. ඒ කියන්නේ ඔබේ හිස මත පව් බර වැඩි කර ගනීවි. එරම පියා පැහැදිලි කරයි: සෑම චක්‍රයක් චක්‍රයක් පාසා ඔබේ තත්ත්වය විනාශ කරගන්න එපා. ඔබ දැන් උසස් තත්ත්වයක් නිර්මාණය නොකලොත් සෑම චක්‍රයක් චක්‍රයක් පාසාම ඔබේ තත්ත්වය එයම වේවි. මෙය දැනුම වේ. එම රාජධානිය පෙර චක්‍රයේ තිබූ සේම ස්ථාපිත වන බව බාබා දන්නවා. බාප්දාදාට තවත් බොහෝ දේවල් වටහා ගත හැකියි. මොහු තමයි විශේෂ ආදරණීය දරුවා. මව්වරුන්ගේ වර්ණනාත් වැඩි වෙන්න ඕන. මව්වරුන්ව ඉදිරියෙන්ම තබා ඇත. බාබා සහෝදරයන්ට පැහැදිලි කරනවා: ඔවුන්ව ඉදිරියට ගෙන එන්න. සහෝදරයන්ටත් බොහෝ සේ සේවය කල හැකියි. පින්තූර පෙන්වා පැහැදිලි කරන්න. මේ තමයි උසස්ම උසස් දෙවියන්. ඉන්පසු ත්‍රිමූර්තීන්, බ්‍රහ්ම විෂ්ණු සහ ශංකර් සිටිනවා. ඔවුන්ගෙන් උසස් කෙනා කවුරුද? කාගේ නම ද සඳහන් කර තිබෙන්නේ? සැවොම කියාවි: අප උරුමය ලබන්නේ ප්‍රජාපිතා බ්‍රහ්මා තුළින්ය කියා. ශංකර්ට හෝ විෂ්ණුට පියා යැයි නොකියනු ඇත. ඔවුන්ගෙන් නොවෙයි ඔබට උරුමය ලැබෙන්නේ. ප්‍රජාපිතා බ්‍රහ්මා කියන්නේ මොහුටයි. ඔබට ඔහුගෙන් කුමන උරුමයක් ලැබෙයි ද? බ්‍රහ්මා ශිව බාබාගේ දරුවෙක්. ශිව බාබා තමයි ඥාන සාගරය, දිව්‍යලෝකය ස්ථාපනය කරන කෙනා. එබැවින්, සැබැවින්ම දිව්‍යලෝකය සඳහා ඔබට ඉගෙනුම ලැබෙනවා. රාජයෝගාව සඳහායි මේ මඟපෙන්වීම් ඇත්තේ. එරම පියා ඔබට බ්‍රහ්මා තුළින් ශ්‍රීමත් ලබා දෙනවා. මෙය ඔබට දේවතාවරු වීම සඳහායි. එම බ්‍රහ්ම කුමාරි පසුව ධනයේ දෙවඟන වූ ශ්‍රීලක්ෂ්මී වෙයි. මේ අය බ්‍රහමින්වරුන්, ඒ අය දේවතාවරුන්. සියල්ලන්ම අශාරීරික ලොවේ ජීව සත්තාවන්. බාබා දරුවන්ට උපරිම තරමින් පැහැදිලි කරනවා. එහෙත් වටහාගන්නා අය පමණක් වටහාගනීවි. සන්‍යාසීන් සහ ගුරුන් ආදීන් තුළින් අන්ධ විශ්වාසයේ සිටි මනුෂ්‍යයන් දේවතාවරු බවට පත්වෙනවා. ඒ අයගෙන් ඔවුන්ට ලැබෙන්නේ කුමක්ද කියාවත් ඔවුන් නොදනී. ගුරුවරයෙක් අවම වශයෙන් දන්නවා ඔබට තනතුරක් ලැබේවි කියා. කෙසේ වෙතත්, ඒ අයගේ ආනුගාමිකයන් වීමෙන් කුමන ලැබීමක් තමන්ට ලැබේවිද කියා ඔවුන් නොදනී. එය අන්ධ විශ්වාසයක්: ඔවුන් අනුගමනය කරන්නත් නොවේ: ඔවුන් ඔබව තමන් වාගේ කරන්නේ වත්, ඔබ ඔවුන් වාගේ වෙන්නේ වත් නැහැ. අරමුණ සහ ඉලක්කය කුමක්ද කියා ඔවුන් කොහෙත්ම දන්නේ නැහැ. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. තරක ආශ්‍රයෙන් සෑම විටම ආරක්ෂා වී සිටින්න. මෙම සැබෑ අධ්‍යයනය හොඳින් ඉගෙන ගෙන සැබෑ ආදායමක් එක්රැස්කර ගන්න.
2. තබනා සෑම පියවරකදීම තමන් බාබාගේ ශ්‍රීමත් අනුගමනය කරනවාය කියා පොරොන්දු වන්න.

**වරදානය:** ඔබ එක්කෙනාට විශ්වසනීයව වරයන් ප්‍රදානය කරන්නාව සතුටු කරවන රහස දත් සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වේවා.

වරයන් ප්‍රදානය කරන්නා (වරධාති) පරම පියාගේ වරයන් අනන්ත අප්‍රමාණව ඇත. එය ඕනෑම කෙනෙකුට තමන්ට උවමනා තරමට අරගත හැකියි: නිධන් ගබඩාව විවෘතව ඇත. එම විවෘත නිධන් ගබඩාවෙන් ඇතැම් දරුවන් පිරී සිටින අතර ඇතැම් දරුවන් තම අවකාශය අනුව පුරවා ගන්නවා. වරධාති ස්වරූපයෙන් අවිහිංසක ස්වාමියා තමයි ඔබේ ඒප්‍රනය බෙහෙවින් පුරවන්නේ. ඔහුව සතුටු කරවන මාර්ගය ඔබ සරලව දැන ගන්න ඕන, එවිට ඔබ සම්පූර්ණ සාර්ථකත්වය ලබනවා ඇත. වරදාන ප්‍රදානය කරන්නා වඩාත් සතුටු වන්නේ එක් පිළිබිඹුවකටයි, එනම්, "එක්කෙනාට විශ්වසනීයව සිටීම (ඒක්වෘත)". අන් කිසිවකු ඔබේ සිතිවිලි හෝ සිහින තුළ පවා නොසිටීවා. ඔබේ ආකල්පයෙහි එක්කෙනා හැරෙන්නට අන් කිසිවකුට අයිති නොවන බව තිබේවා. මෙම රහස දන්නා අයගේ ඒප්‍රන සදා පිරී තිබෙනවා ඇත.

**පාඨය:** ඔබේ සිතිවිලි සහ වචන තුළින් සමගාමීව සේවය කරන විට ඔබ නොකඩවා ද්විත්ව ඵලය ලබනවා ඇත.

*** ඕම් ශාන්ති ***